## 2018 අප්‍රියෙල් මාසය සඳහා අයැදීමට සහ මැදිහත් වීමට අත්වැලක්

**"අප උදෙසා මැරුණේත්, අප උදෙසා මරණයෙන් උත්ථාන වූයේත් ක්‍රිස්තුන් ජේසුස් වහන්සේය. දෙවියන් වහන්සේගේ දකුණු පස වැඩ සිටිමින් අප වෙනුවෙන් මැදහත් වන්නේත් ඔවුන් වහන්සේය. "**

(රෝම 8:34)

කිතුනුවන් වශයෙන් ජේසු ක්‍රිස්තුන් වහන්සේගේ දුක්විඳීම, මරණය හරහා උත්ථාන වූ ජේසු ක්‍රිස්තුන් වහන්සේව හමුන්නට, අත්දකින්නට, ඇසුරු කරන්නට කාලය පැමිණ ඇත. බොහෝ කිතුනුවන් මේ මහා යථාර්ථය තේරුම් නොගෙන ලෞකික චර්නාකම්වල ඇලී ගැලී ජීවත්වීම බෙහෙවින් කණගාටුදායකය. තවත් අය වසරක් පාසා පැවැත්වෙන චතාරික සමයේදී සහ පාස්කු සමයේදී හුදෙක් ජනවන්දනාවට සහ චත්පිළිවෙත්වලට පමණක් සීමා වී පසුව සාමාන්‍ය ජීවිත ගත කරති. එය ඛේදවාචකයකි. සෑම කිතුනුවෙකුටම පමණක් නොව සමස්ත මිනිස් සංහතියටම දෙවියන් වහන්සේ ජේසු ක්‍රිස්තුන් වහන්සේගේ දුක්විඳීම මරණය හා උත්ථානය හරහා ස්වර්ගයට ඇතුල් වීමට දොරටු විවර කර ඇත. කිතුනුවන්ගේ දූත කාර්ය වනුයේ ඒ අයට තම ජීවිත පැවැත්ම තුළින් සාක්ෂි දැරීමයි.

එබැවින් අයැදීමේ සේවකයන් වශයෙන් මේ මාසය පුරාවටම නිරන්තරයෙන් දෙවියන් වහන්සේ ඉදිරියෙහි අප වෙනුවෙන් මැදිහත් වන ජේසු ක්‍රිස්තුන් වහන්සේ හා එක්ව සමස්ත කිතුනු ජනතාවට සමස්ත ලෝක වාසී සියළු ජනතාවටත් මේ මහා යථාර්ථයට ඇතුළු වීමට අවැසි ශුද්ධාත්ම බලය පතා යාච්ඤා කරමු.

**"එහෙත් අපට ප්‍රේම කළ තැනැන් වහන්සේ නිසා අපි මේ සියල්ලේදී ම විජයග්‍රාහී වෙමු. මන්ද මරණයට වත්, ජීවිතයට වත්, දේව දූතයන්ට වත්, භූතාධිපතීන්ට වත්, බලධාරීන්ට වත්, මතු පැමිණෙන කිසිවකට වත් , අතී උසට වත්, මහා ගැඹුරට වත්, මුළු විශ්වයෙහි අන් කිසි මැවිල්ලකට වත් අපගේ ස්වාමින් වන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ තුළ ඇති දේව ප්‍රේමයෙන් අප වෙන් කළ නොහැකි බව ඒකාන්තයෙන්ම දනිමි. "** (රෝම 8:37-39)

පළමු සතිය : දිව්‍යමය කියවීම - රෝම 8:31-39

අයැදීමට විශේෂ යොමුව :

මේ උත්ථාන සමය තුළ සෑම කිතුනුවෙකුම උත්ථාන වූ ස්වාමින් වහන්සේව හමුවෙමින්, අත්දකිමින්, ඇසුරු කරමින් සත්‍යයට සාක්ෂි දැරීමට අවැසි ශුද්ධාත්ම බලය පතා අයැදිමු.

(විනාඩි 10ක් පමණ)

වෙනත් අයැදීම් :

* ස්වාමි තාත්තා, දිවැසි එකතුව, සහයක එකතුව, උපදේශක මණ්ඩලය ඇතුළු පුබුදුව තුළ වගකීම් ගන්නා සියළු දෙනා වෙනුවෙන්
* මාසයේ පළමු ඉරුදින පැවැත්වෙන සාංඝික පවුල් දිනය වෙනුවෙන්
* ශුද්ධාත්ම මහා මංගල්‍යය සඳහා සංවිධාන කටයුතු බාර කමිටුව ඇතුළු ඒ සඳහා විවිධ වගකීම් ගන්නා සියළු දෙනා වෙනුවෙන්.
* අප්‍රියෙල් මස 07 වන දින ප්‍රශංසාරාමයේ පවත්වෙන ඇතුලාන්ත සුව සම්මේලනයට සහභාගී වන ජනතාව සහ වචනයේ සේවකයන්, උපස්ථාන කණ්ඩායම වෙනුවෙන්.
* වෙනත් අයැදීම් ....

දෙවන සතිය : දිව්‍යමය කියවීම - ශු.ලූක් 24:36-43

අයැදීමට විශේෂ යොමුව :

දේශපාලකයන්ගේ කුලල් කා ගැනීම් සහ අන්තනෝමතික ක්‍රියාවන් නිසා අසරණ වී සිටින අප රටේ අසරණ ජනතාවට, විශේෂයෙන් දුගී ජනතාවට සැනසීම සහ සහනය ලැබීමට මගක් ලැබෙන පිණිස. (විනාඩි 10ක් පමණ)

වෙනත් අයැදීම් :

* අප්‍රියෙල් 13-14 දින අප රට තුළ පැවැත්වෙන සිංහල අවුරුදු දිනය අප රට සියළු ජනතාව තුළ එකමුතුකමේ සංහිඳියාවක් ඇතිවන පිණිස.

* ආගම් සහ ජාති බේද අවුස්සන අන්ථවාදීන්ගෙන් අප පුරවැසියන් රැකගන්නා පිණිස.
* මත්පැන්, මත් ද්‍රව්‍යවලට ඇබ්බැහි වී සිටින සහ වෙනත් අපචාරයන් නිසා නොමග ගොස් සිටින තරුණ තරුණියන් සහ වැඩිහිටියන් වෙනුවෙන්.
* වෙනත් අයැදීම්.....

තෙවන සතිය: දිව්‍යමය කියවීම - ශු.ජොහාන් 3:16-20

අයැදීමට විශේෂ යොමුව :

මැයි මස 12 වන දිනය තුළ පැවැත්වීමට බලාපොරොත්තු වන ශුද්ධාත්ම මහා මංගලෝත්සවයේ සංවිධාන කටයුතු කරන සියළු දෙනාද, නුවාන මෙහෙයවන වචනයේ සේවකයන් ද, යාච්ඤා කණ්ඩායමද, මංගල්‍යයට සහභාගි වන ජනතාව ද වෙනුවෙන් යාච්ඤා කරමු. (විනාඩි 10ක් පමණ)

වෙනත් අයැදීම් :

* අප්‍රියෙල් 21-22 දිනවල ප්‍රශංසාරාමයේ පැවැත්වෙන ත්‍රෛ මාසික කඳවුරට සහභාගි වන වගකීම් ගන්නා සියළු දෙනා සහ වචනයේ සේවකයන් වෙනුවෙන්.
* වෙනත් අයැදීම්....

සතරවන සතිය : දිව්‍යමය කියවීම - ශු.ලූක් 11:27-28

අයැදීමට විශේෂ යොමුව :

ශුද්ධාත්ම මංගල්‍යයට සහභාගි වන ජනතාව සහ වචනයේ සේවකයන්, සංවිධාන කටයුතු කරන සියළු දෙනා, වත්පිළිවෙත් අංශය වෙනුවෙන් සහ සේවක අංශයන් වෙනුවෙන්.

(විනාඩි 10ක් පමණ)

වෙනත් අයැදීම් :

* දේශය වෙනුවෙන්
* ශුද්ධාත්ම නුවාන මෙහෙයවන සියළු දෙනා සහ සහභාගි වන ජනතාව වෙනුවෙන්.
* වෙනත් අයැදීම්....

දැන්වීම් :

* සෑම සිකුරාදාම යාච්ඤාව සහ උපවාසයේ දිනයක් වශයෙන් ගත කිරීමට සැලකිලිමත් වන්න.
* කාලීන ප්‍රශ්න වෙනුවෙන් අයැදීමට මැදිහත් වීමට සතිපතා සූදානම්ව සිටින්න.
* වකුගඩු රෝගයෙන් පෙලෙන මට්ටකොටුව ශ්‍රාවක සංඝයේ අයැදීම් එකතුවට සම්බන්ධවන ගනේෂන් තාත්තාට දිව්‍යමය සුවය ලැබෙන පිණිසත්, පුබුදුව තුළ එවැනිම රෝගවලින් පෙලෙන සියළුම දෙනා වෙනුවෙන් යාච්ඤා කරන්න.

- අයැදීමේ සහ මැදිහත් වීමේ සේවාව -

****************************